# 2 බලය විමධ්‍යගත කිරීම හා බෙදාහැරීම

## 2.1 හැඳින්වීම

රාජ්‍යයක ජනගහනය වැඩි වීම, භූමි ප්‍රමාණ පුළුල් වීම ආදි හේතු නිසා එහි පාලනය පිළිබඳ කාර්ය භාරය ද සංකීර්ණ බවට පත් වේ. 17,18 වැනි සියවස්වල ලෝකය පුරා පැතිර ගිය ලිබරල්වාදී අදහස් මගින් මධ්‍යගත ඒකාධිපති පාලනය පැවැති රාජාණ්ඩුක්‍රම විවේචනයට ලක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 18 වන සියවස ආරම්භයේ සිට ම නූතන රාජ්‍යයන්හි පාලන ස්වරූපයන් වෙනස් වන්නට විය. තම රටවල ප්‍රාදේශීය, වාර්ගික, සංස්කෘතික විවිධතා පාලන කාර්යයේ දී ඒකාබද්ධ කර ගැනීම සඳහා මෙම රටවල් අනුගමනය කළ ක්‍රියාමාර්ගවල ස්වරූප දෙකක් ලෙස

i. බලය විමධ්‍යගතකරණය හා
ii. බලය බෙදාහැරීම පෙන්වා දිය හැකි ය.

### 2.1.1 බලය විමධ්‍යගතකරණය

රජයක් සතු ප්‍රධාන බලතල වන ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල බෙදාහැරීමක් නොකර රජයේ පරිපාලනමය බලතල පමණක් ප්‍රාදේශීය මට්ටමින් පවරා දීමේ ක්‍රමය බලය විමධ්‍යගතකරණය ලෙස හඳුන්වයි. මෙහි දී බලය විමධ්‍යගතකරණය සිදුවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නො ව, පාර්ලිමේන්තුව හෙවත් ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරගන්නා පණත් මගින් ය. එම නිසා ඕනෑ ම අවස්ථාවක මෙම බලතල නැවත පවරා ගැනීමේ හා සංශෝධනය කිරීමේ හැකියාව ව්‍යවස්ථාදායකයට හෙවත් පාර්ලිමේන්තුවට තිබේ. ලෝකයේ රටවල් ගණනාවක්, ප්‍රාදේශීය මට්ටම කරා බලය බෙදාහැරීමේ දී ක්‍රියාත්මක කර ඇත්තේ "බලය විමධ්‍යගතකරණය" නම් ක්‍රමයයි.

### 2.1.2 බලය බෙදාහැරීම

"බලය බෙදාහැරීම" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථානුකූල බලතලවලින් නිශ්චිත ව වෙන් කොට ගත් බලතල ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත ලබා දීමකි. මෙම ක්‍රමය බොහෝ විට භාවිත කරන්නේ නූතන බහු සංස්කෘතික රාජ්‍යවල ය. මෙහි දී විවිධ රටවල් විවිධ මට්ටම්වලින් මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දී තිබේ. මෙම බලතල බෙදාහැරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම "ලැයිස්තු මගින්" සිදු කර තිබීම විශේෂ ලක්ෂණයකි. එම ලැයිස්තුවල මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාදේශීය ආණ්ඩුවලට අයත් බලතල වෙන වෙන ම දක්වා තිබේ. බලය බෙදාහැරීම යන්න සෑම රටක ම එක සමාන ව සිදු නොවන අතර ඒ ඒ රටවල් තම රටේ අවශ්‍යතාව අනුව බලය බෙදීම සිදු කර තිබේ.

**ක්‍රියාකාරකම් 2.1**

- බලය විමධ්‍යගතකරණය හා බලය බෙදාහැරීම යන සංකල්පයන්හි මූලික වෙනස්කම් පැහැදිලි කරන්න.

## 2.2 නූතන රාජ්‍යයන්හි බලය විමධ්‍යගතකරණය හා බලය බෙදාහැරීම

නූතන රාජ්‍යයන්හි බලය ක්‍රියාත්මක වන ආකාරය අනුව ඒවා ඒකීය රාජ්‍ය හා සන්ධීය රාජ්‍ය යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්විය හැකි ය.

ඒකීය රාජ්‍යය යනු එක ම මධ්‍යම බල අධිකාරියක් මගින් සියලු පාලන කාර්යයන් මෙහෙයවනු ලබන ආණ්ඩුක්‍රමයකි.

> *සෑම ආකාරයකින් ම අධිකාරිබලය එක් මධ්‍යම බල ආයතනයක් වෙත ඒකරාශීකර ඇති ආණ්ඩුක්‍රමය ඒකීය ආණ්ඩු ක්‍රමයකි.*
>
> ◆ *මහාචාර්ය - හර්මන් ෆයිනර්*

සන්ධීය රාජ්‍යයක් යනුවෙන් අදහස් කරන්නේ මධ්‍යම බල අධිකාරියෙන්, ගිවිසගත් කාරණා පිළිබඳ ව කටයුතු කරන අතර, සෙසු කාරණා ප්‍රාන්ත රාජ්‍යයන් මගින් ක්‍රියාවට නංවන ආණ්ඩු ක්‍රමයන් ය.

> *තම තමන්ගේ බල ක්ෂේත්‍රවල ස්වාධීන ව කටයුතු කරමින්, සමහර කරුණු සම්බන්ධයෙන් එක්සත් ව ක්‍රියාකිරීමට මග පාදන උපාය මාර්ග සහිත ආණ්ඩු ක්‍රමය සන්ධීය ආණ්ඩු ක්‍රමයයි.*
>
> ◆ *කේ. සී. වියර්*

| ඒකීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ | සන්ධීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ |
|---|---|
| ◆ එක් මධ්‍යම ආණ්ඩුවක් පමණක් තිබේ.<br>◆ සෑම පාලන කටයුත්තක් ම මධ්‍යම ආණ්ඩුවෙන් සිදු වේ.<br>◆ සියලු බලතල මධ්‍යගත කොට තිබේ.<br>◆ ආණ්ඩුවේ බලයට අභියෝග කිරීමට ප්‍රාදේශීය පාලන ආයතනවලට නොහැකි වේ.<br>◆ ආණ්ඩුවේ නියෝජිතයින් හා ප්‍රාදේශීය පාලන ආයතනවල නියෝජිතයන් අතර වෙනසක් තිබේ.<br>◆ ප්‍රාදේශීය පාලන ආයතනවල බලතල සම්බන්ධයෙන් අවසන් තීරණ ගන්නේ මධ්‍යම ආණ්ඩුවයි. | ◆ මධ්‍යම ආණ්ඩුවත් ප්‍රාන්ත ආණ්ඩුත් අතර බලතල බෙදා හැර තිබේ.<br>◆ මධ්‍යම ආණ්ඩුවේ හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල සම්බන්ධ ගැටලු විසඳන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි.<br>◆ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා මධ්‍යම ආණ්ඩුවේ මෙන් ම ප්‍රාන්ත ආණ්ඩුවල ද අනුමැතිය අවශ්‍ය වේ.<br>◆ ප්‍රාන්ත ආණ්ඩු නියෝජිතයින් මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක මණ්ඩලය නියෝජනය කරයි.<br>◆ ප්‍රාන්ත ආණ්ඩු කිහිපයක් තිබෙන අතර ඒවාට ඇති බලතල සමාන වේ. |

ඉහත ලක්ෂණ අනුව පෙනීයන්නේ ඒකීය රාජ්‍යයක පාලන ක්‍රියාවලියත්, සන්ධීය රාජ්‍යයක පාලන ක්‍රියාවලියත් එකිනෙකට වෙනස් වන බවයි. එසේ ම ප්‍රාන්ත ආණ්ඩු හෙවත් ප්‍රාදේශීය ආයතන වෙත පාලන බලතල පැවරීමේ දී අනුගමනය කරන ක්‍රමයේ ද වෙනසක් පවතී. ඒ අනුව,

- ඒකීය රාජ්‍යය, බලය විමධ්‍යගත කරන ක්‍රියාවලියක් භාවිත කරයි.
- සන්ධීය රාජ්‍යය, බලය බෙදාහැරීමේ ක්‍රියාවලියක් භාවිත කරයි.

### 2.2.1 ඒකීය රාජ්‍යයන්හි බලය විමධ්‍යගතකරණය (විකේන්ද්‍රණය)

ලෝකයේ රාජ්‍ය වැඩි ප්‍රමාණයක් ඒකීය රාජ්‍ය ලෙස හඳුනාගත හැකි ය. බෙල්ජියම, බල්ගේරියාව, ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය, නෙදර්ලන්තය, ජපානය, පෝලන්තය, ස්පාඤ්ඤය වැනි රටවල් ඊට උදාහරණ වේ. මේ සියලු රටවල් ඒකීය රාජ්‍ය වුවත්, මේවායේ සංයුතිය, ආයතන රටාව හා ප්‍රාදේශීය ආයතන වෙත බලය විමධ්‍යගත කර ඇති ආකාරය එකිනෙකට වෙනස් ය. බලය විමධ්‍යගතකරණයේ දී මෙම රටවල් අනුගමනය කර ඇති ක්‍රම ප්‍රධාන වශයෙන් ආකාර තුනකට වෙන් කර ගත හැකි වේ.

i. **ප්‍රාදේශීය පාලන ආයතන වෙත ව්‍යවස්ථානුගත මූලධර්ම මත නො ව, ව්‍යවහාරික ලෙස බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමය**

මේ ක්‍රමය සඳහා දිය හැකි හොඳ ම උදාහරණය මහා බ්‍රිතාන්‍යයයි. එරට ප්‍රාදේශීය පාලන ආයතන වන උතුරු අයර්ලන්තය, වේල්සය, ස්කොට්ලන්තය හා ලන්ඩනයේ පිහිටි ජාතික ආණ්ඩුව අතර සබඳතාව, ප්‍රාදේශීය ස්වායත්තතාව පිළිබඳ උසස් මූලධර්මය මත පිහිටා ඇත. මෙය සන්ධීය රටක පාලන විධිවිධානවලට සමාන වන අයුරින් බලය විමධ්‍යගත කිරීමක් දක්වා පැතිර ඇති නමුත් ව්‍යවස්ථානුකූල විධිවිධානයක් නො වේ. එමනිසා මෙය සන්ධීය ක්‍රමයක් නො වන්නේ ය.

ii. **ප්‍රාදේශීය පාලන ඒකක වෙත අඩු බලතල ප්‍රමාණයක් විමධ්‍යගත කිරීම හා ප්‍රාදේශීය ව තෝරාගත් ආණ්ඩු, මධ්‍ය ආණ්ඩුවේ දැඩි අධීක්ෂණයට ලක්කිරීමේ ක්‍රමය**

මෙම ක්‍රමය සඳහා දිය හැකි ප්‍රශස්ත උදාහරණය ප්‍රංශයයි. එහි ප්‍රාදේශීය පාලන කටයුතු දෙපාර්තමේන්තු (Departments) හා ඇරොන්ඩිසෙමන්ට් (Arrondissements) යටතේ සිදුකරන අතර, පැරිසියේ මධ්‍ය ආණ්ඩුවෙන් පත්කරනු ලබන ප්‍රිපෙට් (Prefect) හා උප ප්‍රිපෙට්වරයකු යටතේ ඒවායේ පාලන කටයුතු අධීක්ෂණය කරනු ලබයි. මෙම නිලධාරීහු ප්‍රාදේශීය ආණ්ඩුවල විධායක නිලධාරීන් ලෙස ද කටයුතු කරති.

ඡන්දයෙන් පත්කර ගත් නිලධාරීන්ගෙන් සමන්විත කොන්සාලිස් ජෙනරෝ නම් ප්‍රාදේශීය ආයතන, මධ්‍ය ආණ්ඩුවෙන් පත් කළ විධායක නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු සිදුකරයි. මෙහි බලය විකේන්ද්‍රණය වී ඇත්තේ ප්‍රිපෙට්වරයාගේ බලතල කොන්සාලිස් ජෙනරෝ ආයතනය වෙත පැවරීමෙනි.

iii. ප්‍රාදේශීය පාලනය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් මධ්‍යම ආණ්ඩුවෙන් පත්කරන බලධාරියකු වෙත, වගකීමේ ක්‍රමය

මෙම ක්‍රමයේ දී ප්‍රාදේශීය පාලනයට ඡන්දයෙන් තේරී පත්වන නිලධාරීන්ගේ පාලන බලතල අවම මට්ටමක පවතී. මෙහි බලතල ඇත්තේ මධ්‍යම ආණ්ඩුව පත්කරන බලධාරියාට ය. ඇඩොල්ෆ් හිට්ලර්ගේ පාලන සමයේ ජර්මනියේ පැවැතියේ මෙවැනි තත්ත්වයකි. එහි දී ප්‍රාදේශීය පාලන බලධාරීන් ලෙස හිට්ලර් විසින් තමන්ට හිතවත් පුද්ගලයින් පත්කර ගන්නා ලදි. නැගෙනහිර යුරෝපීය කොමියුනිස්ට් රටවල මහජන සභාවල කටයුතු සිදු වූයේ ද මේ ආකාරයට ය.

බොහෝ ඒකීය රාජ්‍යයන් ඉහත ක්‍රම තුන අනුව බලය විමධ්‍යගතකරණයට යොමු වී තිබෙන නමුත්, තවත් රටවල් මෙම ක්‍රම තුනේ විවිධ සංකලන භාවිත කරමින් තම පාලන කටයුතු පවත්වාගෙන යනු දක්නට ලැබේ.

**ක්‍රියාකාරකම් 2.2**

- ඒකීය රාජ්‍ය බලය විමධ්‍යගත කිරීමේ දී අනුගමනය කර ඇති ක්‍රම සැකෙවින් දක්වන්න.
- ඉහත ක්‍රම අතුරින් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී යැයි ඔබ සිතන ක්‍රමය තෝරා ඊට හේතු දක්වන්න.

### 2.2.2 සන්ධීය රාජ්‍යයන්හි බලය බෙදාහැරීම

සන්ධීය හෙවත් පෙඩරල් ක්‍රමයේ දී දේශපාලන බල අධිකාරිය, ස්වාධීන ආණ්ඩුක්‍රම පද්ධතීන් දෙකක් අතර බෙදාහැරීමක් සිදු වේ. නමුත් මෙම බෙදාහැරීම සෑම සන්ධීය රාජ්‍යයක ම එක සමාන නො වේ.

ඇතැම් රටවල් මධ්‍යම ආණ්ඩුවේ බලය විස්තර කර එයට අයත් නොවන ඉතිරි බලතල ශේෂ බලතල ලෙස දක්වා එම බලතල ප්‍රාන්ත ආණ්ඩු වෙත පවරා තිබේ. තවත් රටවල් මධ්‍යම ආණ්ඩුව සතු බලතල හා ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල වෙන වෙන ම විස්තර කර ඇති අතර මෙම ආණ්ඩු දෙකට ම පොදු බලතල සමගාමී බලතල ලෙස දක්වා තිබේ.

සන්ධීය හෙවත් පෙඩරල් රාජ්‍ය කීපයක බලය බෙදා හැර ඇති ආකාරය විමසා බලමු.

#### ස්විට්සර්ලන්තය බලය බෙදාහැර ඇති ආකාරය

13 වන සියවසේ යුරි (Uri), ස්ක්විෂ් (Schwyz) හා අන්ටර්වල්ඩන් (Unterwalden) යන කැන්ටන් තුනකින් ඇරඹි ස්විට්සර්ලන්තය 1848 සම්මත කරගත් සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1874 දී සංශෝධනය කරමින් නූතන සන්ධීය රාජ්‍යය බවට පත්ව ඇත. අද එරට කැන්ටන් ලෙස හඳුන්වන ප්‍රාන්ත රාජ්‍ය 26 කින් සමන්විත සන්ධීය රාජ්‍යයකි. ඉන් 20 ක් පූර්ණ කැන්ටන් වන අතර 6 ක් අර්ධ කැන්ටන් ලෙස හඳුන්වනු ලබයි. 1874 දී සම්මත කරන ලද ව්‍යවස්ථාව වගන්ති 123 කින් යුතු දීර්ඝ ව්‍යවස්ථාවක් වුවත් ඇමෙරිකාවේ මෙන් බලය බෙදාහැර ඇති ආකාරය පැහැදිලි ලෙස ලැයිස්තු ගත කර නැත. මධ්‍යම ආණ්ඩුව සතු බලතල සංක්ෂිප්ත ව පහත දැක්වෙන අයුරින් දැක්විය හැකි ය.

- විදේශ කටයුතු (තානාපතිවරු පත්කිරීම ද ඇතුළු ව)
- යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
- විදේශ රටවල් හා ගිවිසුම්වලට එළඹීම
- ආරක්ෂක හා හමුදා කටයුතු
- පණිවුඩ හුවමාරු තැපැල්, දුම්රිය, විදුලි සන්දේශ, දුරකථන
- මූල්‍ය කටයුතු
- කිරුම් මිනුම්
- රේගු කටයුතු
- වෙළෙඳාම හා කැන්ටන් අතර වාණිජ කටයුතු.
- ප්‍රකාශන හා හිමිකම් පිළිබඳ අයිතිය.
- වෙඩි බෙහෙත් හා මද්‍යසාර පිළිබඳ ඒකාධිකාරය
- මහජන සෞඛ්‍යය
- මුහුදු මාර්ගයෙන් කෙරෙන ප්‍රවාහන කටයුතු

කැන්ටන් හෙවත් ප්‍රාදේශීය පාලන ඒකක වෙත බෙදා ඇති බලතල පහත දක්වේ.

- අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය පිළිබඳ කටයුතු
- පුවත්පත් පාලනය
- මහාමාර්ග
- කර්මාන්ත
- ආගමනය
- බෝවන රෝග වැළැක්වීම
- බැංකු කටයුතු

මෙසේ ව්‍යවස්ථාව මගින් කැන්ටන්වල අභ්‍යන්තර කටයුතුවලට බලපාන කරුණු පිළිබඳ ක්‍රියා කිරීමේ බලය පවරා තිබුණ ද එහි පැහැදිලි බවක් දකිය නොහැකියි. උදාහරණයක් ලෙස ව්‍යවස්ථාවේ 24 වැනි වගන්තිය අනුවගන්ති ගණනාවක් යටතේ දක්වා ඇති අතර මුලින් ම වනාන්තර පාලනය හා පරීක්ෂාව, ගංගා පිළිබඳ පාලනය කැන්ටන්වලට පවරා, එහි තවත් උප වගන්තියකින් පරමාණු බල ශක්තිය පිළිබඳ පාලනය මධ්‍ය ආණ්ඩුව සතු බව කියයි. මේ නිසා බ්‍රයිස්සාමි වරයා පවසා තිබෙන්නේ ස්විට්සර්ලන්තයේ බලය බෙදාහැරීමේ රටාව වෙනත් සන්ධිය රාජ්‍යවලට වඩා අපැහැදිලි බවයි.

ඇමෙරිකානු රටාව තුළ මධ්‍යම ආණ්ඩුවේ බලය ප්‍රකාශ කර ශේෂ බලය ප්‍රාන්තවලට හිමිකර ඇති අතර ස්විට්සර්ලන්තයේ ශේෂ බලය පවරා ඇත්තේ මධ්‍යම ආණ්ඩුව වෙතට ය. එසේ ම බලය බෙදාහැරීම පිළිබඳ ගැටලු ඇති වුවොත් අධිකරණයේ තීරණ නො ව මධ්‍යම ව්‍යවස්ථාදායකයේ තීරණය මූලික වේ. කෙසේ වෙතත් වෙන්කරන ලද බලය සම්බන්ධයෙන් ස්වාධීන ව කටයුතු කිරීමේ හැකියාව ස්විස් කැන්ටන් සතු ව පවතී. නූතනයේ කැන්ටන්වලට ස්වාධීන ව කටයුතු කිරීමේ බලය හිමි ව ඇති අතර ඒවා ක්‍රියාත්මක කරගැනීමේ පූර්ණ බලය සෘජු ප්‍රජාතන්ත්‍රවාදි උපක්‍රම මගින් ජනතාව වෙත පවරා ඇත.

**ක්‍රියාකාරකම් 2.3**

- ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල හා කැන්ටන් (ප්‍රාදේශීය ආණ්ඩු) වලට අයත් බලතල වෙන් වෙන් ව ලැයිස්තු ගත කරන්න.

### 2.2.2 ඇමෙරිකාවේ බලය බෙදාහැරීම

ලෝකයේ සම්භාව්‍ය සන්ධීය රාජ්‍යය ලෙස සලකනු ලබන ඇමෙරිකාව 1789 ප්‍රාන්ත රාජ්‍ය 13 කින් ආරම්භ වී නූතනයේ ප්‍රාන්ත රාජ්‍ය 50 දක්වා වර්ධනය වී ඇත. ආරම්භක යුගයේ ව්‍යවස්ථාව මගින් මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු වෙත බෙදා හැර ඇති බලය අද වන විට යම් යම් අංශවලින් මධ්‍ය ආණ්ඩුව වෙත ඒකරාශී වෙමින් පවතින බව පෙනේ.

ඇමෙරිකානු දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්ධනයත්, ව්‍යවස්ථාව තුළින් මෙන් ම ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තුළින් ජනාධිපතිවරයා වෙත බලය ඒකරාශි කරගැනීමත්, නිසා අද ප්‍රාන්ත රාජ්‍යයන්ට වඩා මධ්‍යම ආණ්ඩුවේ බලය වර්ධනය වී ඇත. වර්තමාන යුධ හා ගැටුම්කාරී සිදුවීම් ජනාධිපතිවරයාගේ බලතල සංකීර්ණ වීමට හේතු වී තිබේ.

ව්‍යවස්ථාවේ පළමු වන වගන්තියේ 8 වන කොටසේ 10 වන ඡේදයට අනුව යුද්ධ ප්‍රකාශ කිරීමේ බලය කොන්ග්‍රස් මණ්ඩලය සතු බව සඳහන් වුවත් අද ඇමෙරිකානු ජනාධිපතිවරු කොන්ග්‍රස් මණ්ඩලයේ අනුමැතියෙන් තොර ව යුධ ප්‍රකාශ කරනවා පමණක් නො ව යුධ කටයුතු මෙහෙයවන අවස්ථා ද ඇත.

ඇමෙරිකානු ව්‍යවස්ථාවේ I වන වගන්තියේ 8,9,10 කොටස් මගින් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලය බෙදාහරින ආකාරය ඉතා පැහැදිලි ව දක්වා තිබේ. එසේ ම මෙම බලතල අතර ගැටුමක් ඇති වුවහොත් එය ශ්‍රේෂ්ඨාධිකරණයේ විමර්ශනයට යොමු වන අතර එහි තීන්දුව ද වැදගත් වේ.

**ව්‍යවස්ථාවේ 1 වන වගන්තියේ 8 වන කොටසට අනුව මධ්‍යම ආණ්ඩුවට කළ හැකි දේ**

- බදු පැනවීම හා එක්රැස් කිරීම.
- ආරක්ෂාව සැලසීම.
- විදේශ වෙළඳාම හා විදේශ කටයුතු.
- පොදු කිරුම් මිණුම් ක්‍රමයක් හා මුල්‍ය ක්‍රමයක් පවත්වාගෙන යාම.
- ජාතික ආර්ථිකය සංවර්ධනය සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම.

**ව්‍යවස්ථාවේ 1 වන වගන්තියේ 9 වන කොටසට අනුව මධ්‍යම ආණ්ඩුවට කළ නොහැකි දේ.**

- හබයාස් කොපුස් ආඥා නිකුත් කිරීමේ බලය තහනම් කිරීම. (කැරලි අවස්ථාවක හැර)
- අතීතයට බලපාන අයුරින් නීති පැනවීම.

- නීතියට පිටතින් භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීම.

ව්‍යවස්ථාවේ 1 වන වගන්තියේ 10 වන කොටසට අනුව ප්‍රාන්ත රාජ්‍යයන්ට කළ නොහැකි දේ

- විදේශ සම්බන්ධතා පැවැත්වීම.
- මුදල් නෝට්ටු නිකුත් කිරීම.
- අධිකරණ කටයුතුවලට බලපාන නීති පැනවීම.
- යුධ හමුදා පවත්වාගෙන යාම.
- ආයාත නිර්යාතවලට බලපාන නීති පැනවීම.
- ජාති, ආගම්, ස්ත්‍රී/පුරුෂභාවය වැනි බෙදීම් මත ඡන්ද බලය අහිමි කිරීම.
- වහල්භාවය ඇති කිරීම.
- සමානාත්මතාව නැති කිරීම.

මෙහි දී මධ්‍යම ආණ්ඩුවට කළ හැකි හා නොහැකි දේ ලෙස ලියා තැබීමෙන් බලතල සීමාවක් වනු ඇත. නමුත් ප්‍රාන්ත රාජ්‍යවලට කළ නොහැකි දේ පමණක් ලියා ඇත. කළ හැකි දේ ලියා නැත. මේ නිසා කළ නොහැකි දේට අමතර ව සීමාවක් නොමැති ව කළ හැකි දේ පවතින බව පෙනේ. ඒ අනුව ඇමෙරිකානු ක්‍රමය යටතේ ප්‍රාන්ත ආණ්ඩුවලට වැඩි බලතල ප්‍රමාණයක් හිමි වන බව පෙනේ. තවද ඇමෙරිකානු ව්‍යවස්ථාවේ යම් සංශෝධනයක් කරන්නේ නම් ඒ සඳහා මධ්‍යම ආණ්ඩුවේ කොංග්‍රසයේ 2/3 ක හා ප්‍රාන්ත රාජ්‍යවල 3/4 ක කැමැත්ත ලබා ගත යුතු වේ.

**ක්‍රියාකාරකම් 2.4**

- ස්විට්සර්ලන්තයේ බලය බෙදාහැරීමේ ක්‍රමයේත් ඇමරිකාවේ බලය බෙදාහැරීමේ ක්‍රමයේත් කැපී පෙනෙන වෙනස්කම් සාකච්ඡා කරන්න.

### 2.2.3 ඉන්දියාව බලය බෙදාහැර ඇති ආකාරය

දිගු කලක් බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවති, 1947 දී නිදහස ලද ඉන්දියාව ඒකාබද්ධ රාජ්‍යයක් ලෙස කටයුතු කිරීමේ ඇති කැමැත්ත නිසා සන්ධීය ආණ්ඩු ක්‍රමය තෝරා ගෙන ඇත. අද ඉන්දියාව ප්‍රාන්ත රාජ්‍ය 26 කින් හා එක්සත් ප්‍රදේශ 6 කින් යුතු සන්ධීය රාජ්‍යයකි. ඉන්දියාව, කැනඩාව සේ ම ලැයිස්තු තුනක් යටතේ බලය බෙදා හැරිය ද ඊට වඩා වෙනස් ස්වරූපයක් ගත් ආණ්ඩුක්‍රමයකි. ඉන්දීය ව්‍යවස්ථාවේ 246 වැනි වගන්තිය මගින් ලැයිස්තු 3 ක් යටතේ බලය බෙදා ඇති ආකාරය සංක්ෂිප්ත ව පහත දැක්වෙන පරිදි ය.

i. ලැයිස්තුව - මධ්‍යම ආණ්ඩුව සතු බලතල (කරුණු 97 ක් යටතේ)
   - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම
   - හමුදා පාලනය
   - විදේශ කටයුතු
   - මූල්‍ය පාලනය

- රටේ ප්‍රධාන සංවර්ධන කටයුතු

ii. ලැයිස්තුව - ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල. (කරුණු 66 ක් යටතේ)

- ප්‍රාදේශිය නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- පළාත් පාලනය
- කෘෂිකාර්මික කටයුතු

iii. ලැයිස්තුව - සමගාමී බලතල (කරුණු 47 ක් යටතේ) මෙයින් ප්‍රාන්ත රාජ්‍ය හා මධ්‍යම ආණ්ඩුව යන දෙ අංශයට ම පොදු බලතල දක්වයි.

- විවාහ හා දික්කසාද
- විදුලි බලය
- ආර්ථික හා සමාජ සැලසුම් කටයුතු

ඉන්දියාව සන්ධීය රාජ්‍යයක් ලෙස බලය බෙදාහැරීමේ දී මෙවැනි රටාවක් අනුගමනය කළ ද එය වෙනත් සන්ධීය රාජ්‍යයන්ගෙන් වෙනස් වන ආකාරයක් දකිය හැකි ය. මන්ද, සම්භාව්‍ය සන්ධීය ක්‍රමයේ මෙන් ඉන්දීය ප්‍රාන්ත රාජ්‍යවලට පුළුල් ස්වායත්තභාවයක් ලබා දී නැත. ඉන්දියානු ව්‍යවස්ථාවේ ප්‍රධාන වගන්ති තුනක් මගින් ප්‍රාන්ත රාජ්‍යවල බලතල සීමා කර ඇත.

249 වගන්තිය - ඉන්දීය රාජ්‍ය සභාවේ (දෙවන මණ්ඩලය) 2/3 කැමැත්ත මත ප්‍රාන්ත රාජ්‍ය වෙත ව්‍යවස්ථාවෙන් පවරා දී ඇති බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා දිය හැකි ය.

250 වගන්තිය - හදිසි අවස්ථාවක් ප්‍රකාශ කළ විටෙක ඕනෑ ම ප්‍රාන්ත රාජ්‍යයක් සතු බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා ගත හැකි ය.

251 වගන්තිය - ප්‍රාන්ත රාජ්‍ය දෙකක් හෝ වැඩි ගණනක කැමත්ත මත ඉල්ලා සිටි විටෙක ප්‍රාන්ත රාජ්‍ය සතු බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා ගත හැකි ය.

මෙම වගන්තිවලට අමතර ව ඉන්දීය ජනාධිපතිවරයා වෙත පවරා දී ඇති බලතල මගින් ද ප්‍රාන්ත රාජ්‍ය සතු බලතල සීමා වේ. ඒ අනුව,

352 වගන්තිය - රටේ ඇති වන හදිසි තත්ත්වයන් යටතේ ජනාධිපතිවරයාට හදිසි නීතිය ප්‍රකාශ කළ හැකි ය. එවැනි අවස්ථාවක ජනාධිපතිවරයාට අධික බලතල හිමි වේ. එම බලතල ප්‍රාන්ත බලය ඉක්මවා යයි.

359 වගන්තිය - හදිසි අවස්ථාවක් ප්‍රකාශ කළ විටෙක මූලික අයිතිවාසිකම් හා නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වීම අත්හිටුවීමට ජනාධිපතිවරයාට බලය ඇත.

360 වගන්තිය - රටේ මූල්‍ය ස්ථාවරත්වය බිඳ වැටී හෝ බිඳ වැටීමට ආසන්න ව ඇතැයි ජනාධිපතිවරයාට හැඟී යන අවස්ථාවල හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි ය. එවැනි අවස්ථාවල දී ද මූලික අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස ක්‍රියාත්මක වීම අත්හිටුවීමේ නියෝග ජනාධිපතිවරයාට, නිකුත් කළ හැකි ය.

මෙවැනි අවස්ථාවල ප්‍රාන්තවල බලය ඉක්මවා මධ්‍යම ආණ්ඩුවේ බලය ඉස්මතු වේ. මේ නිසා ඉන්දියාවේ ක්‍රියාත්මක වන්නේ සන්ධීය ලක්ෂණ පෙන්වන ඒකීය රාජ්‍යයක් බව මහාචාර්ය කේ. සී. වියර් ප්‍රකාශ කර ඇත.

ඉන්දීය ව්‍යවස්ථාව සංශෝධනයේ දී එහි වගන්තිවල ස්වරූපය අනුව විධි ක්‍රම තුනක් අනුගමනය කිරීමට ඉඩ සලසා ඇත. ඒ අනුව සාමාන්‍ය බහුතරයකින් සම්මත කරන වගන්ති, ද්වි මණ්ඩලවල 2/3 ක බහුතරයකින් සම්මත කරන වගන්ති හා ව්‍යවස්ථාදායකයේ 1/2 ක හා ප්‍රාන්ත රාජ්‍යයන් 2/3 ක බහුතරයකින් සම්මත කරන සුවිශේෂී වගන්ති ලෙස දැක්විය හැකි ය.

ඉන්දීය ආණ්ඩුක්‍රමය, වර්ග, ජාති, ආගම්, භාෂා, සංස්කෘතික ආදි ලෙස පවත්නා විවිධත්වයන් එසේ ම පවත්වා ගනිමින් එක ම ජාතියක් ලෙස නැගී සිටීමට දරන ලද ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි.

**ක්‍රියාකාරකම් 2.5**

- ඉන්දීයාව සන්ධීය ලක්ෂණ පෙන්නුම් කරන ඒකීය රාජ්‍යයක් යැයි කීමට හේතු සාධක වූ කරුණු මොනවා ද?

## 2.3 ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම හා බලය විමධ්‍යගතකරණය

බලය විමධ්‍යගතකරණය යන සංකල්පයෙහි සමහර ලක්ෂණ ඉතා ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයේ දී දක්නට ලැබේ. ඒ සඳහා උදාහරණ කීපයක් මෙසේ දැක්විය හැකි ය.

පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ දී (අනුරාධපුර රාජධානිය) එක් එක් ගමකට අයත් ග්‍රාම සීමා වෙන්කර දී, ගම් පාලනය සඳහා ගම්භාර නමින් ගමේ නායකයකු පත්කර ඔහුට යම් යම් නිදහස් තීරණ ගැනීමේ අවස්ථාව ලබා දී තිබුණි.

මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී (පොළොන්නරුව රාජධානිය) ප්‍රාදේශීය පාලකයන් පත්කොට ඔවුන්ට පාලන බලතල පවරා තිබුණි.

බ්‍රිතාන්‍ය යුගයේ මුල් අවධියේ දී "රෙසිටන්ඩ්" වරයකු විසින් උඩරට නීතියට හා පාලන ක්‍රමයට අනුව කන්ද උඩරට රාජධානිය පාලනය කර තිබේ.

ඉහත උදාහරණවලින් පෙනී යන්නේ, යම් යම් වකවානුවල ග්‍රාමසභා, රටසභා, ගම්සභා වැනි බලය බෙදී ගිය ඒකකයන් තිබූ බව හා එම ඒකක තුළ ක්‍රියාත්මක වූ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අවකාශයන්ට ඉඩ ලබා දී තිබූ බව ය.

### 2.3.1 බ්‍රිතාන්‍ය පාලන සමයේ හා නිදහසින් පසුව බලය විමධ්‍යගතකරණයෙහි ස්වභාවය

බ්‍රිතාන්‍ය යුගයේ දී (1865) බලය විමධ්‍යගතකරණය සම්බන්ධයෙන් ගත් පළමු පියවර ලෙස මහනගර සභා ආඥාපනත හඳුන්වා දිය හැකි ය. මේ යටතේ කොළඹ හා මහනුවර මහනගර සභා පිහිටුවනු ලැබී ය.

1871 දී ගම්සභා ක්‍රමය නැවත ආරම්භ කළ බ්‍රිතාන්‍යයන් විසින් 1924 ගම්කාර්ය සභා ආඥාපනත මගින් ගම්සභා වෙත තිබූ බලතල තවදුරටත් පුළුල් කරන ලදී.

1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පිහිටුවන ලද පළාත් පාලනය සම්බන්ධ විධායක කාරක සභාව ද බලය විමධ්‍යගතකරණයේ එක් වැදගත් අවස්ථාවකි. මේ යටතේ පළාත් පාලන අමාත්‍යවරයා ව සිටි එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා 1938 දී ගම්කාර්ය සභාවල බලතල තවදුරටත් පුළුල් කිරීමට පියවර ගත්තේ ය.

1940 දී නගර සභා පිහිටුවීමත් 1943 පළාත් පාලන සේවා ආඥා පනත බිහිකිරීමත් සිදු විය.

1981 දී දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය හඳුන්වා දුන් අතර එහි දී සියලු පළාත් පාලන කාර්යයන් දිස්ත්‍රික් සංවර්ධන සභා 24 ක් වෙත ගොනු කිරීමට උත්සාහ කරන ලදී.

1987 ප්‍රාදේශීය සභා පනත හා 1988 නගර සභා හා මහ නගර සභා ආඥාපනත් මගින් ද බලය විමධ්‍යගතකරණය සඳහා ප්‍රයත්න දරන ලදී.

**ක්‍රියාකාරකම් 2.6**

- බලය විමධ්‍යගතකරණය සම්බන්ධයෙන් ඇති ඓතිහාසික සාක්ෂ්‍ය සොයා, ඒවා පිළිබඳ පන්තියේ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පැරණි ගම්සභාවක හෝ නගර සභාවක ව්‍යූහය දක්වෙන ආකෘතියක් සකස් කරන්න.

### 2.3.2 ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම

බලය බෙදාහැරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ අත්දැකීම් කථාකරන විට දී 1920 දශකයේ පටන් ඒ පිළිබඳ ව අදහස් ඉදිරිපත් වෙමින් පැවති බව පෙනේ. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමේ සිට හෝ පළාත්

මට්ටමේ සිට බලය බෙදාහැරිය යුතු ආකාරය, පැවරිය යුතු බලතල ප්‍රමාණය පිළිබඳ විවිධ යෝජනා ඉදිරිපත් වූ අතර ඊට පක්ෂ හා විපක්ෂ තර්ක විතර්ක ඉදිරිපත් වෙමින් තිබුණි. මෙහි දී 1926 ජූලි 17 දින The Ceylon Morning Leader පුවත්පතට A Federal Government for Ceylon නමින් ලිපියක් ලියමින් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා බහුවාර්ගික රටක ඇතිවන ගැටලු නිරාකරණය සඳහා බලය බෙදාහැරීමේ අත්‍යවශ්‍යතාව මතුකර පෙන්වා තිබුණි. එයින් පසුව වරින් වර බලය බෙදාහැරීම සඳහා මෙවැනි යෝජනා ඉදිරිපත් වුව ද ඊට දැඩි විරෝධතා එල්ල වීම නිසා යටපත් විය. ඒ සඳහා වරින් වර තේරීම් කාරක සභා ද පත්කරනු ලැබී ය. විශේෂයෙන් ම 1947 දී පළාත් පාලන ඇමතිවරයා ව සිටි එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා මේ පිළිබඳ ව නැවත ද අදහස් මතුකර තිබුණි. එතුමා බලය බෙදාහැරීමෙන් විවිධ ජාතීන්ට පාලනය පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් තීරණ ගැනීමට දායක වීමට ඇති හැකියාව වඩාත් අවධාරණය කර තිබුණි. මෙහි දී ඩොනමෝර් කොමිසම ඉදිරිපත් කළ යෝජනාවලට ඉතා වැදගත් තැනක් හිමි වේ.

නිදහසින් පසු පෙඩරල් පක්ෂය විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාවලින් උතුරු, නැගෙනහිර පළාත් සඳහා ස්වාධීන පාලන ක්‍රමයත්, සිංහල, දෙමළ භාෂා රාජ්‍ය භාෂා ලෙස පිළිගැනීමත්, ඉන්දියානු වතු කම්කරුවන් සඳහා පුරවැසිබවත් ඉල්ලා තිබුණි. මෙම අදහස් මත ගොඩ නැගී 1957 ජූලි මස 26 දින බණ්ඩාරනායක මහතා හා චෙල්වනායගම් මහතා අතර ඇති වූ ගිවිසුමෙන් රට සභා පිළිබඳ අදහස් වූ කරුණු පහත දක්වේ.

1. රට සභා ප්‍රදේශ පිළිබඳ ව උපලේඛනයක් යටතේ පනතින් ම කරුණු විස්තර කිරීම.
2. උතුරු පළාත එක් රට සභා ප්‍රදේශයක් බවට පත් කරන අතර නැගෙනහිර පළාත රට සභා දෙකක් හෝ වැඩි ගණනකට බෙදීම.
3. පළාත් සීමා ඉක්මවා වුව ද රට සභා ප්‍රදේශ දෙකකට හෝ වැඩි ගණනකට එක්වීමට විධිවිධාන සැලසීම. පාර්ලිමේන්තු අනුමැතියට යටත් ව රට සභා ප්‍රදේශයක් කොටස්වලට කැඩීමේ අයිතිය සැලසීම හා විශේෂ කටයුතු සඳහා රට සභා කීපයකට සාමූහික ව කටයුතු කිරීමට විධි විධාන සැලසීම.

මෙම කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නො ව පාර්ලිමේන්තු පනතකින් පවරා දීමට යෝජනා වී තිබුණි. එහි දී රට සභාවලට පවරා දිය යුතු විෂයයන් ලෙස

- කෘෂිකර්මය
- සමුපකාර ව්‍යාපාර
- ඉඩම් හා ඉඩම් සංවර්ධනය
- ජනපද පිහිටුවීම
- අධ්‍යාපනය
- සෞඛ්‍යය

- කර්මාන්ත හා ධීවර
- නිවාස හා සමාජ සේවය
- විදුලි බලය
- ජල කර්මාන්තය
- මංමාවත්

සඳහන් කර තිබුණි. නමුත් මෙම යෝජනාවලිය රටේ බහුතර ජනතාවගේ විරෝධය නිසා අතහැර දැමීමට සිදු විය. මෙම යෝජනා 1965 මාර්තුවල ඩඩ්ලි සේනානායක මහතාගේ පාලන සමයේ ද නැවත ඉදිරිපත් වේ. ඒ අනුව ඩඩ්ලි-චෙල්වනායගම් ගිවිසුමේ අඩංගු කරුණු සංක්ෂිප්ත ව පහත දැක්වේ.

❖ උතුරු නැගෙනහිර පාලන හා අධිකරණ කටයුතු දෙමළ භාෂාවෙන් කිරීම.
  - දිස්ත්‍රික් සභා පිහිටුවීම හා ඒවාට විධාන දීමේ බලය රජය සතු බව පිළිගැනීම.
  - ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කර පහත සඳහන් ප්‍රමුඛතා දීම.

අ. උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් ප්‍රදානයේ දී එහි ඉඩම් නැති පුද්ගලයන්ට ප්‍රමුඛතාව දීම.

ආ. දෙවනු ව එහි පදිංචි ද්‍රවිඩ භාෂාව කතාකරන පුද්ගලයන්ට.

ඇ. තෙවනුව දිවයිනේ වෙනත් ස්ථානයන්හි පදිංචි ද්‍රවිඩ පුරවැසියන්ට හා ලංකාවේ වෙනත් පුරවැසියන්ට ලබා දිය යුතු බව.

මෙම අදහස් අනුව 1968 ජුනි මාසයේ දී කෙටුම්පතක් සකස් කිරීමට තීරණය වූ අතර එම අදහස් ධවල පත්‍රිකාවක් ලෙස ප්‍රකාශයට පත් විය. එහෙත් මෙම යෝජනා ක්‍රියාත්මක නො වී ය. එයින් උතුරු නැගෙනහිර පළාත් දකුණේ සෙසු පළාත්වලින් පැහැදිලි ව වෙන්වන බවට චෝදනා එල්ල වුණි. එයින් 1957 රට සභා මෙන් ම 1968 දිස්ත්‍රික් සභා යටතේ ද බලය බෙදාහැරීමට අවධානය යොමු විය.

**ක්‍රියාකාරකම 2.7**

- බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ගැන තවත් තොරතුරු එකතු කරන්න.

1970 බලයට පත් වූ සමගි පෙරමුණු ආණ්ඩුව විසින් 1973 දී ඇති කරන ලද දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය යටතේ ද බලය බෙදාහැරීම සඳහා කටයුතු කර තිබුණි. 1977 දී බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් 1980 අංක 35 දරන පනත යටතේ ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම සංවර්ධන සභාවක් යෝජනා කරන ලදී. එමගින් සුළු නගර සභා හා ගම් සභා අහෝසි කර දිස්ත්‍රික්කයක් සඳහා මහජන ඡන්දයෙන් තෝරා පත්කරන ලද සංවර්ධන සභාවකට ව්‍යවස්ථාදායක හා විධායක බලතල පවරන ලදි. මෙම යෝජනා ද ක්‍රියාත්මක තත්ත්වයේ නො පැවතිණ.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභා ක්‍රමය ඇති කරන ලදී. 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් බලය බෙදාහැරීම ලැයිස්තු තුනක් යටතේ සිදු කරන ලදි.

1 වන ලැයිස්තුව

1. **පළාත් සභා ලැයිස්තුව විෂයයන් 37 ක් යටතේ.**
    - මධ්‍ය ආණ්ඩුව නිශ්චය කරන පෙදෙස්වල මහජන සාමය පවත්වාගෙන යාම
    - ආර්ථික සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
    - පළාත් පාලන කටයුතු
    - නිවාස හා ඉදිකිරීම්
    - ජාතික මහා මාර්ග හැර සෙසු මාර්ග ඉදිකිරීම හා නඩත්තුව
    - සමාජ සේවා හා පුනරුත්ථාපන කටයුතු
    - කෘෂිකර්ම හා ගොවිජන සේවා
    - ග්‍රාම සංවර්ධනය
    - සෞඛ්‍ය සේවය (ශික්ෂණ හා විශේෂ කාර්ය සඳහා වූ රෝහල් හැර)
    - දේශීය වෛද්‍ය කටයුතු
    - වාණිජ කටයුතු හා ආහාර බෙදා හැරීම
    - සමුපකාර කටයුතු
    - ඉඩම් හා වාරිමාර්ග
    - සත්ත්ව පාලනය
    - මත්පැන් තබා ගැනීම හා ප්‍රවාහන බලපත්‍ර ගාස්තු
    - මෝටර් රථ වාහන ආඥා පනත යටතේ අය කරන ගාස්තු

මෙම කරුණුවලට අදාළ ව ඒ ඒ පළාත තුළ නීතිය හා සාමය පවත්වා ගනිමින් සේවා සැපයීම, සම්පත් සංවර්ධනය, කළමනාකරණය හා සංවිධානය සඳහා අවශ්‍ය ප්‍රඥප්ති පැනවීමේ බලය පවරන ලදී.

2 වන ලැයිස්තුව

2. **මධ්‍යම ආණ්ඩුවේ ලැයිස්තුව (සංවෘත ලැයිස්තුව) විෂයයන් 16 ක් යටතේ,**
    - රටේ ජාතික ආරක්ෂාවට අයත් සියලු කාර්ය (ත්‍රිවිධ හමුදා හා ජාතික පොලීසිය)
    - විදේශ කටයුතු ජාත්‍යන්තර සබඳතා ඇතුළු ව
    - තැපැල්, විදුලි සංදේශ, ගුවන් විදුලිය හා රූපවාහිනිය
    - අධිකරණ කටයුතු, ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය
    - ජාතික සම්පත්, මූල්‍ය කටයුතු හා විදේශ සම්පත් පිළිබඳ
    - විදේශ වෙළෙඳාම, අන්තර් පළාත් වාණිජ කටයුතු
    - වරාය, නැව් තොටවල් හා නාවුක කටයුතු
    - ගුවන් ගමනාගමනය හා ගුවන් තොටුපොළ පිළිබඳ කටයුතු

- ජාතික ප්‍රවාහනය
- ගංගා හා ජලමාර්ග පිළිබඳ කටයුතු
- ඛණිජ ද්‍රව්‍ය හා පතල් කටයුතු
- ආගමන, විගමන හා පුරවැසිබව පිළිබඳ කටයුතු
- සියලු ම මැතිවරණ කටයුතු
- ජන හා සංඛ්‍යා ලේඛන කටයුතු
- ජාතික ලේඛනාගාරය පිළිබඳ කටයුතු
- ජාතික කිරුම් මිණුම් පිළිබඳ කටයුතු
- අන්තර් පළාත් සංක්‍රමණයට අදාළ කටයුතු

ජාතික ලෙස වැදගත් විෂයයන් පිළිබඳ ව සවිස්තර කරුණු සංවෘත ලැයිස්තුවෙන් දක්වා තිබුණි.

3 වන ලැයිස්තුව

3. **සමගාමී ලැයිස්තුව (පොදු බලතල) විෂයයන් 36 ක් යටතේ**
   - සැලසුම් සම්පාදනය පළාත් මට්ටමේ සැලසුම් ද ඇතුළත් ව
   - රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේ ම ප්‍රගති පාලනය
   - ජාතික හා උසස් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම
   - ජාතික නිවාස ඉදිකිරීමේ කටයුතු
   - සමාජ සේවා හා පුනරුත්ථාපන
   - කෘෂිකර්මය හා ගොවිජන සේවා
   - පළාත් තුළ සෞඛ්‍යය සැලසුම්කරණය
   - වාරිමාර්ග කටයුතු
   - ග්‍රාම සංවර්ධනය
   - සත්ත්ව පාලනය
   - සංචාරක ව්‍යාපාරය
   - සේවා නියුක්තිය

මධ්‍යම හා පළාත් සභා යන දෙඅංශයට ම පොදු විෂයයන් පිළිබඳ ව පුළුල් ව කරුණු දක්වා තිබුණි. මේ අයුරින් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සන්ධීය ස්වරූපයේ පුළුල් බලය බෙදාහැරීමක් කර තිබුණි.

**ක්‍රියාකාරකම් 2.8**

අ. 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරන ලද බලය බෙදාහැරීම ලැයිස්තු ගතකර පංති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

ආ. ඔබේ පළාත් සභාවට අදාළ කාර්යභාරයන් සිදුවන ආකාරය අධ්‍යයනය කරන්න.

## 2.4 පළාත් සභාවක සංයුතිය (සැකැස්ම) හා ව්‍යුහය


පළාත් සභාවක සංයුතිය තීරණය කළේ ජනගහනය හා භූමි ප්‍රමාණය අනුවයි. ආසන්න ලෙස වර්ග සැතපුම් 1000 කට හා ජනගහනයෙන් 40,000 කට එක් මන්ත්‍රීවරයෙකු පත්කළ යුතු ය, යන පදනම මත පළාත් සභාවේ මන්ත්‍රී සංඛ්‍යාව තීරණය කරන ලදී. සංශෝධිත ව්‍යවස්ථාවේ 154 වගන්තිය ප්‍රකාර ජනාධිපතිවරයා විසින් සෑම පළාත් සභාවකට ම නමක් දී තෝරා පත් කළ යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව නියම කළ යුතු විය. මැතිවරණයේ දි එක් දිස්ත්‍රික්කයක් මැතිවරණ කොට්ඨාසයක් ලෙස සලකන ලදී. ඒ අනුව එක් පළාත් සභාවක් එක් මැතිවරණ කොට්ඨාසයකින් හෝ උපරිම ලෙස මැතිවරණ කොට්ඨාස තුනකින්වත් සමන්විත විය යුතු විය. මුළු ලංකාව ම සඳහා තෝරාගන්නා පළාත් සභා මන්ත්‍රීවරු 455 ක් විය. ඉන් 437 ක් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ද 18 ක් ප්‍රතිලාභ මන්ත්‍රීවරු ලෙස ද තෝරාගැනීමට නියම ව තිබුණි. මැතිවරණයේ දී ඒ ඒ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබා ගත් ඡන්ද ප්‍රමාණයන් පදනම් කරගෙන සමානුපාතික නියෝජන ක්‍රමය මත මන්ත්‍රීවරු බෙදා වෙන්කරන ලද අතර ඔවුන් පෞද්ගලික ව ලබාගත් මනාප සංඛ්‍යාව අනුව ඒ ඒ පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායමේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කරන ලදී.

සෑම පළාත් සභාවක ම නාමික විධායක ලෙස ආණ්ඩුකාරවරයෙක් මහ ඇමතිවරයාගේ ද අදහස් මත ජනාධිපතිවරයා විසින් පත්කරන ලදී. ආණ්ඩුකාරවරයාට ජනාධිපතිවරයාගේ කැමැත්ත ඇති තාක් කල් හෝ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ විශ්වාසය ඇතිතාක් කල් අවුරුදු 5 ක කාලයක් සිය ධූරය දැරිය හැකි විය. මන්ත්‍රීවරුන්ගේ 2/3 ක බහුතර කැමැත්ත මත ගෙන එනු ලබන විශ්වාසභංග යෝජනාවකින් ආණ්ඩුකාරයා ධූරයෙන් පහ කළ හැකි විය. මහ ඇමතිවරයා හා සාකච්ඡා කර ආණ්ඩුකාරයාට පළාත් සභාව කැඳවීම, කල්තැබීම හා විසුරුවා හැරීම කළ හැකි ය.

මහ ඇමතිවරයා පළාත් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා විය. ඒ ඒ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් අතුරින් උපරිම විශ්වාසය දිනාගත් තැනැත්තා මහ ඇමති ලෙස ආණ්ඩුකාරයා විසින් නම්කරන ලදි. මැතිවරණයක දී පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් 1/2 ට වැඩි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් දිනා ඇති පක්ෂයේ නායකයා ආණ්ඩුකාරයා විසින් මහඇමති ලෙස පත් කළ යුතු විය. මහඇමතිවරයා තම මන්ත්‍රීවරුන් අතුරින් සිව් දෙනකු අභිමතය පරිදි ඇමතිවරුන් ලෙස තෝරා පත් කරගත යුත්තේ ය. මහඇමති ඇතුළු ඇමතිවරු තම කටයුතු පිළිබඳ ව පළාත් සභාවට සාමූහික ව වගකීමට බැඳී සිටිති.

සෑම පළාත් සභාවකට ම මහාධිකරණයක් පිහිටුවිය යුතු බව ව්‍යවස්ථාවේ සඳහන් වේ. මහාධිකරණ විනිසුරුවරු අගවිනිසුරු විසින් පත් කෙරෙති. ඒ ඒ පළාත් සභාවට අදාළ අධිකරණ කටයුතු මෙම උසාවි මගින් සිදු කෙරේ. තීන්දු සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන ඕනෑ ම තැනැත්තකුට අභියාචනාධිකරණයට අභියාචනා ඉදිරිපත් කළ හැකි ය.

## පළාත් සභාවක ව්‍යුහය



13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව උතුරු නැගෙනහිර ඒකාබද්ධ වූ එක් පළාත් සභාවක් ඇතුළු ව පළාත් සභා 8 ක් ක්‍රියාත්මක විය. ටික කලකින් යම් යම් හේතූන් මත උතුරු නැගෙනහිර පළාත් සභාව ජනාධිපතිවරයා විසින් විසුරුවා හරින ලදී. පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවකට අනුව උතුරු හා නැගෙනහිර පළාත් සභා සඳහා වෙන වෙන ම පළාත් සභා 02ක් ස්ථාපිත කෙරිණි. ඒ අනුව දැනට පළාත් සභා 09ක් ක්‍රියාත්මක වේ.

**ක්‍රියාකාරකම් 2.9**

1. ඔබ අයත් ප්‍රදේශයේ පළාත් සභාව හඳුනාගන්න. එහි ව්‍යුහය විස්තර කර සටහන් ගත කරන්න.
2. පළාත් සභා ක්‍රමය ඔබ පළාතේ සංවර්ධනයට දායක වී ඇති ආකාරය සාකච්ඡා කරන්න.
3. පළාත් සභා ක්‍රමයෙහි යම් දුබලතා වේ නම් ඒවා විසඳා ගත හැක්කේ කෙසේ ද යි යෝජනා කරන්න.